## සම්මානයේ සද්දය හා දුම

මව් රටේදී හෝ විදේශයකදී තමන් ජීවත් වන සමාජය තුළදී ජනතාව හා සමාජය වෙනුවෙන් කරන කැපවීම්, දක්ෂතා, පරිත්‍යාග හා සේවාවන් වෙනුවෙන් කරන කවර ඇගයීම් වුවත් බොහෝම වටිනවා. එය මුදලින් සහතිකපත් හෝ සම්මානයක් ලෙස ප්‍රදානය කෙරුණත් ප්‍රතිඵලය විය යුත්තේ ලබන්නා තුළ තෘප්තියක් හා දිරි ගැන්වීමක් ජනිත කරවීමයි. ඕනෑම ක්‍රියාවලියක් තුළ සියල්ලන්ම තෘප්තිමත් කිරීම අපහසු වුවත් මෙවැනි ඇගයීම් ප්‍රදානයන් තුළදී සිදුවන අසාධාරණයන් අවම කිරීම සංවිධායකයින් සතු දැඩි වගකීමක්. ඒත් බොහෝ වේලාවන් තුළ ප්‍රශ්න මතුවන්නේ ඇගයීම් සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේ ප්‍රමිතිය හා තේරීම් සිදුකරන කමිටු පිළිබඳවයි.

සමාජ සේවා ඇගයීම් සඳහා සුදුස්සන් තෝරා ගැනීම කූපන් ක්‍රමයකින් හෝ ඡන්ද විමසීමකින් කිරීම හා අවසාන විනිශ්චයන් අදෘෂ්‍යමාන කමිටුවකින් සිදුකිරීම කොයිතරම් දුරට සාධාරණදැයි යළිත් සිතා බැලිය යුතු කාරණයක්.




මේ ක්‍රමය උචිත වන්නේ ජනප්‍රියතාවය මැනීම සඳහා බව පොදු මතයක්.

කෙසේ වෙතත් ආකර්ශනීය මාධ්‍ය ප්‍රචාරයන් පෙරටු කරගෙන සද්චේතනාවෙන් පටන් ගත් බව කීවද ක්‍රියාත්මක තලයේදී බලලුන් මලු වලින් එළියට පැනීමෙන්ද ප්‍රතිඵල නිකුත්වීමේදී බත් ඇති තැනටම කොස් බෙදීමෙන්ද ඉතිරි වී ඇත්තේ සද්දය හා දුම පමණක් බව පොදු මතයයි. අපගේ කණගාටුව එයයි.

## ප්‍රෙස්ටන් ගැන්සියට

මේ ලියන්නේ අපේ චන්ඩි මල්ලිලා කට්ටියට පොඩි උපදේශයක්. අපි දැන් වරක් දෙවරක් නොව දෙතුන් වරක්ම ඔයාලගේ කෙරුම් දැක්කා. ඒ දුකටයි මේ ලියන්නේ. මල්ලිලා මේ අහන්න. අපිත් අපේ රටේදී ඕන තරම් ඔය වගේ දේවල් දැකලා ඒවාට සහභාගි වෙලා, අත් විඳලා තියෙනවා. ඒවා ඇති වෙලා තමයි දෙයියනේ කියලා මෙහේ ඇවිත් කලබලයක් නැතිව ජීවිතේ ගෙනියන්නේ. අපි දන්නවා ඔයාලත් මෙහේ එන්න කොයි තරම් කට්ටක් කනවද කියලා. දෙමව්පියෝ ඉඩ කඩම් උගස් තියලා, බැංකුවලට ලක්ෂ 20-30 පෙන්වලා ඔයාලව මෙහේ එව්වේ කප්පරක් බලාපොරොත්තු ඇතිව කෝස් එකේ ගාන හොයාගෙන අතට කීයක් හරි වැඩිපුර ආවම සේරම අමතකයි. ආයිත් අර පරණ ලංකාවේ ගති මතුවෙනවා.

ඔයාලා අර මේරියන්ස්ලාගේ සංගීතේ කෑවා. මේ පාර ඉරාජ්ලගේ සංගීතෙත් වණ කලා. **මල්ලිලා මෙහේ මිනිස්සු දවස් පහම යන්ත්‍ර වගේ වැඩ කරලා ගත කරන ජීවිතේ ඉඳලා හිටලා ලබන සතුටත් නැති කරන්න ක්‍රියාකරන එක වැරදියි.** මං හිතන්නෙ දැං ඔය වලි වලට තිත තියන්න කාලේ ඇවිත්. ඔයාලා ගැන සමාජය අවදියෙන් දැනුවත් වෙලා ඉන්නේ. මතක තියා ගන්න තාමත් මේක නීතිය රැකෙන රටක්. එනිසා ප්‍රවේසමෙන්....

## ගිවිසුම් - කොමිෂන්

මේ වනවිට ලංකාවේ ගිවිසුම් ගැනීම හා කොමිෂන් සභා පත්කිරීම ජනතාවට හාස්‍යයක් වෙලා. පත් කරපු එකම කොමිසමකින් හෝ අවසන් ප්‍රතිඵලයක් ලැබුනාද? අත්සන් තැබූ එකදු ගිවිසුමක් හෝ හරිහැටි ක්‍රියාත්මක උනාද? මෙතෙක් ගැසූ කිසිදු ගිවිසුමකට වඩා මහින්ද - රනිල් ගිවිසුම ගැන මාධ්‍ය වාර්තා කරනවා. එය ලංකා දේශපාලන ඉතිහාසයේ සන්දිස්ථානයක් ලෙස සිතීමට, සුභවාදී ලෙස බැලීමට අප හුරුකරවීම සඳහා මාධ්‍ය පෙළ ගැස්වී සිටිනවා. ඒත් මේ ගිවිසුමෙහි මාධ්‍ය හුවා නොදක්වන පැත්ත ගැන කිසිවෙක් නොසිතීම අභාග්‍යයක්. මූලික වශයෙන් රටක විපක්ෂය පවතින රජය හා එක්වීම තුළ රටේ දේශපාලන බලතුලනය බිඳියාම නිසා ඇති විය හැකි ජනතාවට අහිතකර තත්ත්වය ගැන කිසිවෙක් කතා නැහැ. ප්‍රධාන විපක්ෂයක් නැතිවීම තුළ රජයකට දරදඬු ඒකාධිපති පාලනයක් කරා යාමේ ඇති පහසුකම ගැන කිසිදු කථාවක් නැහැ. ඒ තුළ සේවක අයිතීන් කප්පාදුවට, කම්කරු ශ්‍රමය සූරාකෑමේ හා මර්ධනය කිරීමේ හා ඊට අවශ්‍ය අණපනත් ගෙන ඒමට ඇති හැකියාව ගැන අවධානයක් නැහැ. සියල්ලන්ගේම අවධානය යොමුවී ඇත්තේ ත්‍රස්තවාදී මැඩලීම ගැන පමණයි. රට යනු යුද්ධමය පමණක් නොවේ. අප මේ ගිවිසුම ගැන මේ ආකාරයෙන් සිතිය යුත්තේ මේ ප්‍රධාන පක්ෂ දෙකේම කල් ක්‍රියාවන් පසුගිය අඩ සියවරක් තිස්සේ දැන් අත්විඳ ඇති නිසාය.

## කැඳවුම්කරුට ....

මෙල්බන් සිංහල ගුවන් විදුලිය මහජන මුදලින් පවත්වාගෙන යන්නේ කුමකටද වග නැවත සිහිපත් කිරීමට සිදුවීම ගැන කණගාටුයි. මෙල්බන්වාසීන් මෙයට මුදල් පරිත්‍යාග කරන්නේ හොඳ වැඩසටහන් මෙන්ම මෙහි වෙසෙන ආධුනික කලාකරුවන්, නිවේදකයින්, සම්පාදකවරුන්ට මේ ගුවන් විදුලිය තුළින් කිසියම් සේවයක් අතදීමක් වේ යැයි යන සද්චේතනාවෙනුයි. **ගුවන් කාලය පුරාම පටිගත කරන ලද වැඩසටහන් හා මුදල් අය කරන නිවේදක නිවේදිකාවන් යොදවමින් අපගේ නිවේදකයින් ගොළුවන් කරවමින් ඔබ මේ කරන්නේ කවර නම් ගුවන් විදුලියක්ද?**

මේ ගුවන් විදුලියෙන් ඉදිරියට ගත යුත්තේ මුදලට වැඩ කරන නිවේදක නිවේදිකාවන් නොව අඩුපාඩු ඇතත් මෙහි වෙසෙන අපේ නිවේදකයින්ය නිවේදිකාවන් ය. මුදලට කල හැකි දේ තුළ සීමාවක් ඇති බවත්, හැකියාවට අතදීම තුළ දුර ගමනක් යාහැකි බවත් සිහි කරන්නට කැමැත්තෙමු.

මෙහි වෙසෙන ගායක ගායිකාවනට වැඩි ඉඩක් ලබා දෙනවා යයි ඔබ දුන් පොරොන්දුව අද අමතක වෙමින් පවතින්නේ යයි අපට දැනෙයි. නොවැම්බර් 5 වන ඉරිදා එක් ගීයක් පමණි. 12 වන ඉරිදා එකක් වත් නැත. ඔබ කළ යුත්තේ පරණ කාණ්ඩය කළ දේම ද?

ඔබ ස්වේච්ඡාවෙන් කරන සේවාවට වටිනාකමක් ලැබෙන්නට නම් ඔබ ඒ පිළිබඳව විමසිල්ලෙන් සිටිය යුතු බව අවධාරණය කරන්නෙමු.

## නො: 13

සාධාරණ
යුක්ති ගරුක
සමාජයක් ගොඩනැගීමේ
පිවිතුරු චේතනාවෙන්
සටන් වැදුනු ජීවිත පරිත්‍යාග කල
විජේවීර ගමනායක ඇතුළු
දහසක් සොයුරු කැල
ගෞරවයෙන් සමරමු.
සදා සමරමු සොහොයුරෝ....




WRITTEN BY AN INDIAN SOFTWARE ENGINEER.

As the dream of most parents I had acquired a degree in Software Engineer and joined a company based in USA, the land of braves and opportunity.

When I arrived in the USA, it was as if a dream had come true. Here at last I was in the place where I want to be. I decided I would be staying in this country for about Five years in which time I would have earned enough money to settle down in India.

My father was a government employee and after his retirement, the only asset he could acquire was a decent one bedroom flat.

I wanted to do some thing more than him. I started feeling homesick and lonely as the time passed. I used to call home and speak to my parents every week using cheap international phone cards. Two years passed, two years of Burgers at McDonald's and pizzas and discos and 2 years watching the foreign exchange rate getting happy whenever the Rupee value went down.

Finally I decided to get married. Told my parents that I have only 10 days of holidays and everything must be done within these 10 days. I got my ticket booked in the cheapest flight. Was jubilant and was actually enjoying hopping for gifts for all my friends back home.? If I miss anyone then there will be talks. After reaching home I spent home one week going through all the photographs of girls and as the time was getting shorter I was forced to select one candidate.

In-laws told me, to my surprise, that I would have to get married in 2-3 days, as I will not get anymore holidays. After the marriage, it was time to return to USA, after giving some money to my parents and telling the neighbors to look after them, we returned to USA.

My wife enjoyed this country for about two months and then she started feeling lonely. The frequency of calling India increased to twice in a week sometimes 3 times a week. Our savings started diminishing.

After two more years we started to have kids. Two lovely kids, a boy and a girl, were gifted to us by the almighty. Every time I spoke to my parents, they asked me to come to India so that they can see their grand-children.

Every year I decide to go to India. But part work part monetary conditions prevented it. Years went by and visiting India was a distant dream. Then suddenly one day I got a message that my parents were seriously sick. I tried but I couldn't get any holidays and thus could not go to India. The next message I got was my parents had passed away and as there was no one to do the last rights the society members had done whatever they could. I was depressed. My parents had passed away without seeing their grand children.

After couple more years passed away, much to my children's dislike and my wife's joy we returned to India to settle down. I started to look for a suitable property, but to my dismay my savings were short and the property prices had gone up during all these years. I had to return to the USA.

My wife refused to come back with me and my children refused to stay in India. My 2 children and I returned to USA after promising my wife I would be back for good after two years.

*I decided that had enough and wound-up every thing and returned to India.*

Time passed by, my daughter decided to get married to an American and my son was happy living in USA. I decided that had enough and wound-up every thing and returned to India. I had just enough money to buy a decent 02 bedroom flat in a well-developed locality.

Now I am 60 years old and the only time I go out of the flat is for the routine visit to the nearby temple. My faithful wife has also left me and gone to the holy abode.

Sometimes I wondered was it worth all this? My father, even after staying in India, had a house to his name and I too have the same nothing more.

I lost my parents and children for just ONE EXTRA BEDROOM.

Looking out from the window I see a lot of children dancing. This damned cable TV has spoiled our new generation and these children are losing their values and culture because of it. I get occasional cards from my children asking I am alright. Well at least they remember me.

Now perhaps after I die it will be the neighbors again who will be performing my last rights, God Bless them. But the question still remains 'was all this worth it?'

**I am still searching for an answer .....!!!!**